**පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර හා වෙළඳ, නිවාස හා**
**ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බ.ප**

# බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

මෙම අධිකාරියේ බත්තරමුල්ලේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ පුරප්පාඩුව පවතින මතු දැක්වෙන තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම් පිණිස සුදුසුකම් ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් වෙතින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**01.** I) **අභ්‍යන්තර විගණක** MM 1-1-II **- පුරප්පාඩු 01**

II) **තාක්ෂණික නිලධාරී** JM 1-1-II **- පුරප්පාඩු 01**

**02. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද.**

I) **අභ්‍යන්තර විගණක** - MM 1-II

**භාහිර අයදුම්කරුවන්**

පහත i. හෝ ii. හෝ iii. සුදුසුකම් සපුරා තිබීම.

i. ව්‍යාපාර/රාජ්‍ය පරිපාලනය, ගණකාධිකරණය, වාණිජ්‍යය හෝ කළමනාකරණය සඳහා වන වි.ප්‍ර.කො මගින් පිළිගනු ලබන සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

ii. ICASL අන්තර්මධ්‍ය සහතිකය / ආවසරික II සහතිකය ලබා තිබීම.

iii. CIMA හෝ ACCA හි තෙවන කොටස (Part III) සමත්වීම.

iv. ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යායතනය මගින් පිරිනැමෙන ගිණුම්කරණය සඳහා වන උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) ලබා තිබීම.

**සමග**

සුදුසුකම් ලබාගැනීමෙන් පසු, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ගණකාධිකරණ / විගණක ක්ෂේත්‍රයක ලද අවුරුදු තුනක (3) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ පළමු ශ්‍රේණියේ (ගණකාධිකරණ / විගණන) තනතුරක වසර 5 සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

II) **තාක්ෂණික නිලධාරී** JM 1-1-II

පහත i. සහ ii. සුදුසුකම් සප්පුරා තිබීම.

i. සිවිල් ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය, සංඛ්‍යාන විද්‍යාව, ප්‍රමාණාත්මක ශිල්ප ක්‍රම යන විෂයයන් සඳහා වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මගින් පිළිගැනෙන සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

ii. සුදුසුකම් ලබාගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් ලද අවුරුද්දක (1) සේවා පළපුරුද්ද.

**03. වැටුප් පරිමාණයන් හා වයස් සීමාව,**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.

| වැටුප් කේතයන් | වාර්ෂික වැටුප් පරිමාණය | | වයස 2021/07/...... දිනට (අවුරුදු) |
|---|---|---|---|
| | 2020 ජනවාරි සිට බල පැවැත්වෙන | 2021 වර්ෂයේ වැටුප (රු.) | |
| MM 1-1-II | රු. 53175-10X1375+15 X 1910 = රු.95575/- | රු. 53,175 | 22ට නොඅඩු 45ට නොවැඩි |
| JM 1-1-II | රු. 42600-10X755+18 X 1135 = රු.70580/- | රු.42600 | |

**04. බඳවා ගැනීමේ ක්‍රමය,**

සියලු තනතුරු සඳහා බඳවා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ආකාරය පහත පරිදි වේ.

| නිර්ණායකය | ලකුණු ප්‍රමාණය |
|---|---|
| අදාළ අමතර පළපුරුද්ද සඳහා | 30 |
| අදාළ අමතර අධ්‍යාපන සුදුසුකම් සඳහා | 30 |
| වෙනත් කාර්යසාධන / ජයග්‍රහණ | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධන මට්ටේටම | 25 |
| **මුළු ලකුණු** | **100** |

**05. වෙනත් ප්‍රතිලාභ,**

- ❖ අධිකාරී / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා චක්‍රලේඛ මගින් අනුමත සියලු දීමනා.
- ❖ කාර්මික නිලධාරි තනතුර සඳහා අධිකාරිය මගින් නඩත්තු කෙරෙන යතුරු පැදියක් සපයනු ලබන අතර, ඒ සඳහා මාසික ඉන්ධන දීමනාවක්ද හිමිවේ.
- ❖ කාර්යාලයෙන් බැහැර රාජකාරි සඳහා අනුමත විශේෂ දීමනා
- ❖ වෛද්‍යාධාර යෝජනා ක්‍රම ප්‍රතිලාභ
- ❖ කම්කරු රක්ෂණ වන්දි

**06. සේවා කොන්දේසි සහ පොදු විධිවිධාන,**

**සෑම අයදුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, අවම වශයෙන් බස්නාහිර පළාතේ වසර තුනක(3) ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම බස්නාහිර පළාත තුළ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

III. යහපත් චරිතයකින් යුක්ත අයකු විය යුතුය.

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය. භාහිරින් බඳවාගන්නා සෑම අයදුම්කරුවෙක්ම වසර 03ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. සෑම සේවකයෙක්ම සිය මාසික වැටුපෙන් සේවක අර්ථ සාධක අරමුදලට 8% කින් දායක විය යුතු අතර, අධිකාරිය මගින් 12% ක් බැර කරනු ලැබේ. තවද සේවක භාරකාර අරමුදලට අධිකාරිය මගින් 3% ක් බැර කරනු ලැබේ.

**07. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය,**

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල ඡායාපිටපත් තමා විසින් සකසා ගත් අයදුම්පත සමග අමුණා 2021.08.02 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සිය ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "............................" තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර භාරගනු නොලැබේ. අයදුම්පත්‍ර ලැබුණු බවට දන්වා එවනු නොලැබේ.

**ඕ.ඩබ්. ප්‍රසන්න සංජීව,**
**සභාපති,**
**බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,**
**අංක 89, "රන්මගපාය" කඩුවෙල පාර, බත්තරමුල්ල.**
**2011.07.16**